සටහන සහ ඡායාරූප - ලාල් ජයසුන්දර

# ලොව ප්‍රථම වරට ශ්‍රී ලංකාවේදී නිෂ්පාදනය කළ සියයට සියයක් ස්වාභාවික සහ කාබනික 'Biofilm' ජෛව පොහොර

## 'පරිසර හිතකාමී පොහොර නියමු ව්‍යාපෘතිය' යටතේ කුරුණෑගල හා අම්පාර දිස්ත්‍රික්කවලට නොමිලේ

**- ජාතික මූලික අධ්‍යයන ආයතනයේ මහාචාර්ය ගාමිණී සෙනවිරත්න**

ගෙවී යන දිනවල කොරෝනාවටත් වඩා ගොවි ජන දිවිය අවුල් කළ කරුණක් ලෙස පොහොර හිඟය ගොවි ජනතාවගේ චෝදනාවට ලක්විය. රජයේ සහනාධාරය නැතත් පොහොර ටික මුදල් ගෙවා ලබාගැනීමේ ක්‍රමයක් සකස් කරන්න යැයි ගොවියෝ චෝදනා කළහ. ඒ අතර රසායනික පොහොර ගෙන්වීමේ නොහැකියාව ඇතුළු විවිධ කරුණු රාජ්‍ය බලාධිකාරය විසින් පවසන විට ඇතැම් තැනක ගොවියෝ 'අපට නම් කාබනික පොහොර දියර තියෙනවා' යැයි ජනමාධ්‍ය හරහා පැවසූහ.

මේ සම්බන්ධයෙන් මධ්‍යම රජයේ උසස් අධ්‍යාපන තාක්ෂණ හා නවෝත්පාදන අමාත්‍යාංශයට අනුයුක්ත ජාතික මූලික අධ්‍යාපන ආයතනය විසින් සකස්කර ජනතාව අතරට පත්කෙරන ජෛව පොහොරක් පිළිබඳ ගොවිබිමේ කා අතරත් කතාබහ විය.

ඒ කතාබහට සවන්දීමට අපි මහනුවර හන්තාන මූලික අධ්‍යයන ආයතනයේ අදාළ කටයුත්තට මාර්ගෝපදේශකත්වය සපයමින් මූලික වන මහාචාර්ය ගාමිණී සෙනවිරත්න මහතා හමුවුණෙමු.

### ලංකාවේ පොහොර භාවිතය සහ එයින් ඇතිවන වාසි හෝ අවාසි ගැන කෙටි පැහැදිලි කිරීමක් කළොත්?

රසායනික පොහොර ආනයනය සඳහා ශ්‍රී ලංකාව වසරකට රුපියල් බිලියන 50ක් පමණ වැය කරනවා. එයින් පොහොර සහනාධාර වශයෙන් රජය රුපියල් බිලියන 40ක් වැය කරනවා. ජෛව විද්‍යාත්මකව සශ්‍රීක වූ සාරවත් භවභෝග සඳහා අතීතයේ කීර්තියට පත් ශ්‍රී ලංකාව පසුගිය අවුරුදු 60ක කාලය පුරා රසායනික පොහොර අධික වශයෙන් භාවිත කිරීම නිසා පස දූෂණය වී, වගාවන්ට සහ ජනජීවිතයට අභියෝගාත්මක තත්ත්වයක් උදාවුණා.

තව තවත් අධික ලෙස රසායනික පොහොර වගාවන් සඳහා භාවිත කිරීම සහ විවිධ වසංගත රෝගවලින් වගාවන් බේරාගැනීම සඳහා වැඩි වශයෙන් පළිබෝධ නාශක භාවිත කිරීම නිසා කෘෂි රසායනික භාවිතයේ උගුලකට ශ්‍රී ලංකාව හසුවී තිබීම කවුරුත් දන්නා දෙයක්.

### එම අභියෝගය වෙනුවෙන් ඔබ ආයතනය ගත් පියවර පැහැදිලි කළොත් ?

මෙම තත්ත්වය හමුවේ නැවුම් බලාපොරොත්තු දල්වමින් උසස් අධ්‍යාපන, තාක්ෂණ හා නවෝත්පාදන අමාත්‍යාංශයට අනුයුක්ත ශ්‍රී ලංකාවේ ප්‍රමුඛ පර්යේෂණ ආයතනයක් වන 'ජාතික මූලික අධ්‍යයන ආයතනයේ' (National Institute of Fundamental Studies - NIFS) අවධානය යොමු කළා.

එහිදී විද්‍යාඥයන් කණ්ඩායමක් වසර 15කට අධික කාලයක් පුරා පර්යේෂණයන් කළා. එහි ප්‍රතිඵලයක් හැටියට පරිසර හිතකාමී ජෛව පොහොර නිෂ්පාදන තාක්ෂණයක් සොයා ගැනීමට අපට හැකිවුණා.

ලොව ප්‍රථම වරට ශ්‍රී ලංකාවේදී නිෂ්පාදනය කළ මෙම පොහොර මගින් රසායනික පොහොර භාවිතය 50%ක් දක්වා අඩු කළ හැකියි. අනෙක එයින් ප්‍රධාන වාණිජ වගාවන්ගේ පලදාව 10-30%ත් අතර ප්‍රමාණයකින් වැඩි වීමටද හේතු වෙනවා.



බයෝෆිල්ම් යෙදූ වගාව ගොවියාගේ වම් අත පැත්තේ පුවරුව සහිත යායෙන් දැක්වෙයි



### මෙහි අන්තර්ගතය සම්බන්ධයෙන් විස්තර කළොත්?

ශ්‍රී ලංකාවෙන් පමණක් ලබාගන්නා අමුද්‍රව්‍යවලින් නිෂ්පාදනය කරන 'Biofilm' නම් මෙම ජෛව පොහොර පරිසර හිතකාමී, 100% ස්වාභාවික සහ රසායනික ද්‍රව්‍යවලින් තොර කාබනික නිෂ්පාදනයක් ලෙස පළමුව තහවුරු කළ යුතුයි.

බැරලෝහ වන කැඩ්මියම් (Cadmium - Cd), ආසනික් (Arsenic - As), ලෙඩ් (Lead - Pb) සහ මර්කරි (Mercury - Hg) Biofilmහි අඩංගු වන්නේ නැහැ. ඒ නිසා සිරුරට අහිතකර ක්ෂුද්‍ර ජීවීන් කිසිවක් මෙම නිෂ්පාදනයේ අඩංගු වන්නේත් නැහැ. එය මෙරට වගා ක්ෂේත්‍රයට යහපත් පණිවුඩයක් වගේම ජනතාවටද සුබ ආරංචියක්.



බයෝෆිල්ම් නොයෙදූ සහ යෙදූ වෙනස

### රසායනික පොහොරට පුරුදු වූ ගොවියාට මේ ජෛව පොහොර පිළිබඳ පවතින විශ්වසනීයත්වය කෙබඳු විය හැකිද?

වසර ගණනාවක් පුරා Biofilm ජෛව පොහොර කෘෂිකාර්මික වගා බිම්වලට සාර්ථකව අත්හදා බැලීමෙන් අනතුරුව මේ වන විට වී වගාව සඳහා හඳුන්වා දී තිබෙනවා.




අතිගරු ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතාගේ සංකල්පයක් මත නිරෝගී සහ ඵලදායී පුරවැසියෙක් බිහිකිරීම යන තේමාව යටතේ ගොවි ජනතාව ක්‍රමානුකූලව පූර්ණ වශයෙන් කාබනික පොහොර භාවිතයෙන් වස විසෙන් තොර ආහාර නිෂ්පාදනය සඳහා දිරිගැන්වීමට කාබනික පොහොර නොමිලේ ලබාදීමට වැඩපිළිවෙළක් 2020 යල කන්නයේ සිට ක්‍රියාත්මක වන බව ඔබ දන්නවා ඇති.

Biofilm ජෛව පොහොර නිෂ්පාදනයද මෙම 'පරිසර හිතකාමී පොහොර නියමු ව්‍යාපෘතිය' සඳහා තෝරාගෙන තිබෙනවා. ඒ අනුව යල කන්නය තුළදී කුරුණෑගල හා අම්පාර දිස්ත්‍රික්කවල අක්කර 15,000ක පමණ රසායනික පොහොර භාවිතය 25%ක් අඩු කර Biofilm ජෛව පොහොර භාවිතයෙන් වී වගා කිරීමට නියමිතයි.

මහවැලි, කෘෂිකර්ම, වාරිමාර්ග හා ග්‍රාමීය සංවර්ධන අමාත්‍යාංශයේ ජාතික පොහොර ලේකම් කාර්යාලය මගින් මෙම පරිසර හිතකාමී පොහොර ව්‍යාපෘතිය මෙහෙයවනු ලබන අතර, ඒ සඳහා ජාතික මූලික අධ්‍යයන ආයතනය (NIFS) සිය සහයෝගීතාවය සපයනවා.

### Biofilm ජෛව පොහොරවලින් ඇතිවන වාසි මොනවාද?

රසායනික පොහොර භාවිතය අඩු කර වැඩි පලදාවක් ලබාගත හැකියි.

10-30%ක ප්‍රමාණයකින් ඵලදාව වැඩි කරයි.

පසේ පාරිසරික සාධක වැඩි කර ශක්තිමත් මුල් පද්ධතියක් ඇති කරයි.

පසෙහි නයිට්‍රජන් තිර කිරීම වැඩි කර නියඟයන්ට ඔරොත්තු දීමේ හැකියාව වර්ධනය කරයි.

පසේ වගාවට හිතකර ක්ෂුද්‍ර ජීවීන්ගේ ගහනය වැඩි කර රෝගවලට ඔරොත්තු දීමේ හැකියාව වැඩි කරයි.

### මේ සියල්ල තුළ ඔබට දැනෙන හැඟීම කෙබඳුද?

සියයට සියයක් ස්වාභාවික සහ කාබනික Biofilm ජෛව පොහොර භාවිතය මගින් මෙරට වගා බිම් යළි සාරවත් කරගත හැකියි.

ජනතාවගේ සෞඛ්‍ය රැක ගැනීම පමණක් නොවෙයි රසායනික පොහොර ආනයනයට වැය කරන අතිවිශාල ධනස්කන්ධය රට තුළම ඉතිරිකර ගැනීමට Biofilm ජෛව පොහොර මගින් හැකියාව ලැබෙයි.

ඇත්තෙන්ම ජාතික වැදගත්කමක් දක්වන මෙවැනි කාලීන පර්යේෂණ සඳහා මූල්‍ය දායකත්වය ලබාදෙන උසස් අධ්‍යාපන, තාක්ෂණ හා නවෝත්පාදන අමාත්‍යාංශය වෙත ජාතියේ පැසසුම හිමිවිය යුතුයි.

ඒ වගේම නිරෝගී අනාගත පරපුරක් සඳහා අපගේ කෘෂිකාර්මික වගා බිම් සුරැකීමට අත්වැල් බැඳ ගනිමුයි කියන ආයාචනය මට තියෙනවා.